# ජල සමාගම් සමග යුද්ධයට



යුද්ධ නිර්මාණය වන්නේ ස්වභාවික සම්පත්වලට පවතින තරගය මතය. ඛනිජ තෙල් සොයාගනු ලැබූ සෑම රටක්ම අද යුද්ධයකට පැටලී ඇත. මන්ද වර්තමානයේ අවශ්‍යම අමුද්‍රව්‍යයක්ව පවතින හෙයිනි. නමුත් ඛනිජ තෙල් වලින් නික්මෙන දවසක මේ යුද්ධ අවසාන වනු ඇත. ඛනිජ තෙල් වෙනුවට තවත් විකල්ප නම් ඕනෑ තරම් සොයා ගත හැක. ඒත් වතුර ගැන අර්බුදයක් ඇති වුවහොත් අපට විකල්ප නැත.

ඒ නිසා අනාගත ලෝකයේ ජලය යනු වටිනාම සම්පතකි. මේ වන විටත් ලෝකයේ ජල බැංකු පිහිටුවා ජලය විකිණීම ආරම්භ කර ඇත. ඛනිජ තෙල් වලට ඇවිලෙන යුද්ධයන් සේම බොලිවියාව වැනි රටවල ජලය වෙනුවෙන් යුද්ධයක් ඇවිලේ. බොලිවියාවේ වතුර විකුණූ බිචෙල් සමාගමට විරුද්ධව තිබූ නඩුව ඉවත් කර ගන්නා ලෙස රටවල් 43ක් ඉදිරිපත් වූහ. බොලිවියාවෙන් බිචෙල් පැරදුන ද බුෂ් ඉරාකයේ ප්‍රතිසංස්කරණ වැඩ බාර දී සහයෝගය දෙන තරම් සමාගම් වෙනුවෙන් ලෝකයම එක තැනකය. මේ අනුව තෙල් සමාගම් තරම්ම ජල සමාගම් ප්‍රබල තැනකට පැමිණ ඇත.

අද වන විට ශ්‍රී ලංකාවේ බින්න බැස සිටින ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) කටයුතු කරනුයේ ද ලෝකයේ ජල වෙළෙඳපොළ නිර්මාණය කිරීමටය. ඩොලර් වලට කෑදර අපේ ඇත්තන් ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය ගෙන්න ගත්තේ ශ්‍රී ලංකාවේ ජල කළමනාකරණ අවශ්‍යතාවයක් පිළිගනිමින්ය. මේ දෙගොල්ලන් සැකසූ ජල ප්‍රතිපත්ති බොහොමයකි. ඒ සියල්ලෙහි අඩු වැඩි වශයෙන් ජලය මිල කිරීමට කරුණු ගොනු විය. ඒ විතරක් ද, ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය බත්තරමුල්ලේ කාර්යාලයක් දැම්මේ පාර්ලිමේන්තු පනතකින් තම ආයතනගත කරමිනි. එහිදී ජලය මිල කිරීමේ බලතල ලබා දීමට අපේ ඇත්තන් නොපැකිලිව කටයුතු කළහ. සත්තකින්ම අපට ජලය පිළිබඳ දැනෙන නොවටිනාකම මඳ නිසාදෝ ජලාධාර ප්‍රදේශ වැනසීමත් ජලය අපිරිසිදු කිරීමත් නිරන්තරව සිදු කරයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අද බොහෝ ප්‍රදේශයන්හි ජලය හිඟ වීමත් පවතින ජලය භාවිතා කළ නොහැකි වීමත් සිදු වී ඇත.

මේ විනාශය පෙන්නුම් කරන සරලම සාධකයක් ලෙස ජලය බෝතල් කරන සමාගම් සිය ගණනකට රිසි පරිදි ජලය විකිණීමට අප රටේ වෙළෙඳපළක් නිර්මාණය වී තිබීමයි. මෙයින් ජල දූෂණයේ තත්ත්වය මනාව විදහාපා යි. නමුත් එයින් බෝතල් ජලය පිරිසිදු යයි අප සහතික නොකරන්නෙමු.

දැනට අපට බෝතල් ජලයට පමණක් මුදල් ගෙවීමට සිදුව තිබීම එක් අතකින් වාසනාවකි. අනාගතයේ අප පරිහරණය කරන ජලය වෙනුවෙන් බොහෝ සමාගම් මේ භූමිය අරක් ගනු ඇත. එවිට ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) උපදෙස් දී ඇති පරිදි සියලු රටවැසියන්ට තම පරිහරණ ජලය වෙනුවෙන් මුදල් ගෙවීමට සිදු වනු ඇත. මේ සඳහා ප්‍රමුඛ වන සමාගම් පිළිබඳව තොරතුරු මේ වන විට ලැබී ඇත. ජල පරිභෝජනය කරන පාරිභෝගිකයින් වශයෙන් මේ පිළිබඳව නිසි අවධානයකින් නොසිටියහොත් ලොව ස්වභාවික සම්පත්වලට ගිජු කමින් තම ව්‍යාපාර පවත්වාගෙන යන සමාගම්වල කූට උපක්‍රමයන්ට අපත් ගොදුරු වන කාලය වැඩි ඈතක නොවනු ඇත.දැනුවත්ව මේ පිළිබඳව විමසිලිමත් වන්න.

**ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය**

අංක 09, පළමු පටුමග, විනාත පාර, ගංගොඩවිල, නුගේගොඩ.

Tel : + 94 - (0)11- 2817156 Fax : + 94 - (0)11- 4305274 Web: www.greensl.net E -Mail: office@greensl.net